## ශ්‍රී ලංකා එනර්ජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2016

-------------------------------------------------------

ශ්‍රී ලංකා එනර්ජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි ("සමාගම") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ සමාගම සහ එහි පරිපාලිතයන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ("සමූහය") ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරනු ලබන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබාගන්නා ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

හමන අළු සහ යබොර භාවිතා කර සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනයන් නිෂ්පාදනය කිරීම හා විකිණීම සඳහා ශ්‍රී ලංකාවේ බද්ධ ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම උදෙසා සමූහය විසින් අම්වරඩ් හෝල්ඩින්ග්ස් ප්‍රයිවට් ලිමිඩට් සමඟ 2012 ජූලි 27 දින බද්ධ ගිවිසුමකට එළඹ තිබුණි. සමූහය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට රු.7,364,447 ක් ආයෝජනය කර තිබුණි. කෙසේ වුවද, 2014 මාර්තු 27 දින ගිවිසුම අවසන් කිරීමට මණ්ඩලය තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් දරන ලද පිරිවැය අයකර ගැනීම සම්බන්ධයෙන් වූ ප්‍රමාණවත් හා උචිත සාක්ෂි ලබාගැනීමට අපහට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, කරන ලද ආයෝජනය සම්බන්ධ කිසිදු හානිකරණ අලාභයක් හඳුනාගැනීමට අවශ්‍ය වන්නේද යන්න තීරණය කිරීමට අපහට නොහැකි විය.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වියහැකි බලපෑම හැර 2016 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) විගණන මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත සඳහන් පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ,

- මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් ලබා ගන්නා ලද බව සහ මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් විය හැකි බලපෑම හැර 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 සහ 153 වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූල බවත්ය.

## 2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2016 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (ප්‍රයිවට්) ලිමිටඩ්හි ගෙවිය යුතු එකතු කළ අගය මත බදු (VAT) ශේෂය රු.28,682,944 ක් වුවද, ගෙවිය යුතු තථ්‍ය එකතු කළ අගය මත බදු (VAT) ශේෂය රු.16,904,819 ක් පමණක් විය. එකතු කළ අගය මත බදු (VAT) අනුපාතවල වූ වෙනස්කම් හේතුවෙන් සමාගම විසින් රු.11,791,191 ක් වූ එකතු කළ අගය මත බදු වැඩිපුර රැස් කර තිබුණි. කෙසේ වුවද, රු.16,904,819 ක මුදලින් සමාගම විසින් රු.1,000,000 ක් පමණක් ගෙවා තිබූ අතර ශේෂය වූ රු.15,904,819 ක මුදල 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට පටහැනිව 2018 සැප්තැම්බර් 30 වන විටත් රඳවාගෙන තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හා එහි පරිපාලිතයන්ගේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.93,216,780 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. 27,315,567 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.65,901,213 ක වර්ධනයක් දැක්වුණි. පරිපාලිතයන්හි දළ ලාභය රු.86,856,448 කින් වැඩිවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව, සමාගම විසින් සංයුක්ත සැලැස්මක් හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

#### 4.1.2 මෙහෙයුම් සහ සමාලෝචනය

(අ) සම්ප්‍රේෂණ මාර්ග හා ග්‍රිඩ් උපපොළවල් ඉදිකිරීම, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති හා විදුලිබල උත්පාදනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම හා මෙහෙයවීම, පුනර්ජනනීය බලශක්තිය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම හා ලංකා විදුලිබල මණ්ඩලයේ සේවාවන් වෙනුවෙන් මිනිස් බලය සැපයීම හා බඳවාගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා 2011 ජනවාරි 09 දින සමාගම සංස්ථාපනය කර තිබුණි.

2016 වර්ෂය අවසාන වන විට සමාගම විසින් සමනළ වැව ප්‍රදේශයේ කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකර සාර්ථක ලෙස ක්‍රියාත්මක කර තිබූ අතර එය එහි පරිපාලිතයක් වන කුඹලගමුව මිනි හයිඩ්‍රො (ප්‍රයිවට්) ලිමිටඩ් සතුව පැවතුණි. එසේම, වෙනත් ජලවිදුලි බලාගාරයක් ඉදිකිරීම සඳහා දැදුරු ඔය මිනි හයිඩ්‍රො (ප්‍රයිවට්) ලිමිටඩ් යන නමින් තවත් පරිපාලිතයක් සංස්ථාපනය කරන ලදි. සමාගම විසින් වර්ෂයේදී මනු පුවරු නිෂ්පාදනය සඳහා නව ව්‍යාපෘතියක නිරතව සිටියද එහි වාණිජ මෙහෙයුම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (ප්‍රයිවට්) ලිමිටඩ්හි ප්‍රධාන කාර්යය වනුයේ ලංකා විදුලි බල

මණ්ඩලයේ සේවාවන් සඳහා මිනිස් බලය බඳවා ගැනීම සහ සැපයීම වේ. 2,800 කට ආසන්න මිනිස් බලයක් සමාගමෙහි සේවයේ නියුතු අතර 2016 ඔක්තෝබර් අවසානය වන විට සේවකයන් සියලුදෙනාම පාහේ ලංකා විදුලිබල මණ්ඩලයට අන්තර්ග්‍රහණය කර තිබුණි. එසේම, 2018 අගෝස්තු අවසානය වන විට සමාගමෙහි රැඳී සිටි සේවකයන් සංඛ්‍යාව 11 ක් පමණක් විය. කෙසේ වුවද, අපගේ ඉල්ලීම පරිදි, කිසිදු ලිඛිත කුවිතාන්සියක් හෝ ලංකා විදුලිබල මණ්ඩලයට අන්තර්ග්‍රහණය කරන ලද මිනිස්බල ලැයිස්තුවක් ඉදිරිපත් කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් හා ගබඩා සත්‍යාපනය කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කර නොතිබුණි.

(ආ) අවශ්‍ය අත්සන් නොමැති වීම හේතුවෙන් එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා වූ චෙක්පත ප්‍රතික්ෂේප වී තිබුණු බැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රු.1,040,692 ක් දඩ වශයෙන් අය කර ගෙන තිබුණි.

## 4.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධිමත් අනුමැතිය ලද බඳවාගැනීමේ පටිපාටියකින් තොරව කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදු කර තිබුණි.

(ආ) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ (ආ) පරිච්ඡේදය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන සමාගම විසින් සේවකයන් හත්දෙනෙකු බඳවා ගෙන තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

හමන අළු සහ යබොර භාවිතා කර සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනයන් නිෂ්පාදනය කිරීම හා විකිණීම සඳහා කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම වෙනුවෙන් සමූහය විසින් සම ව්‍යාපාරික අම්ට්‍රැඩ් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිඩට් සමඟ 2014 දෙසැම්බර් 31 දිනට රු.7,364,447 ක් ආයෝජනය කර තිබුණි. කෙසේ වුවද, අලෙවිය සඳහා ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන් බද්ධ ව්‍යාපාර ගිවිසුම අවසන් කර තිබුණි. තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාව අනුව, 2016 ජුනි 30 දිනට දේපළවල තක්සේරුව රු.3,200,000 ක් වූ අතර, එකී වත්කම් 2014 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි. කෙසේ වුවද, වත්කම් ලංකා විදුලිබල මණ්ඩලය වෙත භාරදීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබූ අතර, 2016 නොවැම්බර් 10 දින සාමාන්‍යාධිකාරී වෙත ලිඛිත ඉල්ලීමක් කර තිබුණි. නමුත්, ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2018 දෙසැම්බර් 31 දින වන විටද වත්කම් භාර ගෙන නොතිබුණි.

**5.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------------

**5.1** **වාර්ෂික වාර්තාව**

-------------------

සමාගම විසින් ආරම්භයේ සිටම වාර්ෂික වාර්තා පිළියෙල කර නොතිබුණි.

**5.2** **ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------

සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3** **අභ්‍යන්තර විගණනය**

----------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ හා ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකක විසින්ද 2016 වර්ෂය තුළ කිසිදු විගණනයක් සිදු කර නොතිබුණි.

**5.4** **විගණන කමිටු**

-------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදයට අනුව, විගණන කමිටු අවම වශයෙන් මාස තුනකට වරක් හෝ විධිමත් පදනමක් මත රැස්විය යුතුය. කෙසේ වුවද, සමාගම විසින් විගණන කමිටු පිහිටුවා නොතිබුණි.

**5.5** **අයවැය පාලනය**

-------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදයට අනුව, සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

----------------------

අභ්‍යන්තර පාලන දුර්වලතා හෝ සිදුවිය හැකි දෝෂ සහ අක්‍රමිකතාවයන් වළක්වා ගැනීම හා හඳුනාගැනීම සඳහා වූ පාලනයන් දැක්වෙන ලිඛිත ක්‍රියාපටිපාටි අත්පොතක් ඉදිරිපත් කර නොතිබුණි.